ප්‍රචාරක දැන්වීමකි

Australian Government

# ඔබ දරුවෙකු බලාපොරොත්තුවෙන් සිටින වැඩකරන දෙමාපියෙකු නම්, ඔබට බලාපොරොත්තුවිය හැකි වෙනත් දෙයක් ඇත




උප ශීර්ෂය 2011 ජනවාරි පළමුවෙනි දින ඕස්ට්‍රේලියානු රජය ඕස්ට්‍රේලියාවේ පළමුවෙනි ජාතික වැටුප් (Paid Parental Leave) සහිත නිවාඩු වැඩසටහන හඳුන්වා දෙන ලදී. එය වැඩකරන දෙමාපියන්ට ඕස්ට්‍රේලියානු රජයේ ප්‍රතිපාදන මගින් ලබාදෙන අලුත් අයිතිවාසිකමකි.

අලුතෙන් ලැබෙන ළදරුවෙකු වෙනුවෙන් වැඩවලින් කාලයක් නිදහස්ව සිටීම වැඩ ජිවිතයේ සාමාන්‍ය කොටසකි. වැටුප් සහිත ෙ දමාපිය නිවාඩුව අලුතෙන් ලැබුනු ළදරුවා සමග දෙමාපියන්ට කාලයක් ගතකිරීමට උපකාර වනවා මෙන්ම සේවාදායකයනට කුසළතා සම්පන්න කාරයමණ්ඩලයක් පවත්වාගැනීමට උපකාර වේ.

### *වැටුප් සහිත දෙමාපිය නිවාඩුව යනු කුමක්ද?*

සුදුසුකම් ඇති වැඩකරන දෙමාපියන්ට රජයේ ප්‍රතිපාදන වලින් සති 18 කට ජාතික අවම වැටුප වන දැනට බදු වලට පෙර සතියකට ඩොලර් 570 අලුතෙන් ලැබුණු දරුවා රැකබලාගැනීම පිණිස ලැබෙනු ඇත. දරුකමට දරුවන් හදාවඩාගන්නා දෙමාපියන්ටද සුදුසුකම් ලබාගතහැකිය.

### *මට සුදුසුකම් ඇත්ද?*

පුර්ණකාලීන, අර්ධ කාලින, තාවකාලික, සෘතුමය, කොන්ත්‍රාත්මය සහ ස්වයංවෘත්තික ශ්‍රමිකයන්ට සුදුසුකම් ලැබිය හැකිය. ඔබේ ළදරුවා ඉපදීමට පෙර මාස 13 නෙන් මාස 10 කට (සතියකට එක් දිනකට පමණ වැඩියෙන්) ඔබ අඩුම වශයෙන් පැය 330 ක් වැඩකර තිබිය යුතුය. ඔබට වැඩ කරන දින දෙකක් ඇතුළත සති අටක විවේකයක් ලබාගන්නා අතර සුදුසුකම් ද ලැබිය හැකිය. ඔබට වර්ෂයකට ඩොලර් 150,000 ක් (පෞද්ගලික වැටුප) ඉපයිය හැකි වන අතර එත් සුදුසුකම් ලැබිය හැකිය.

### *එය දෙමාපියන් දෙදෙනාටමද?*

ඔව්, සාමාන්‍යයෙන් මව ඉල්ලුම් කළ යුතුය. ඔබ සුදුස්සෙකු වනුයේ නම්, ඔබට ඔබේ මුළු වැටුපම හෝ කොටසක් ඔබේ සහකරුවාට (ඔවුන් සුදුස්සෝ විය යුතුය) මාරු කළ හැකිය. මෙම වැඩසටහන වැඩ සහ පවුල අතර සමබරතාවය ඇතිකරගැනීමට පවුල්වලට වැඩි විකල්ප ලබාදෙයි.

### *කවදාද මට එය ලබාගන්න පුළුවන්*

මාස 3 ක් දක්වා කලින් ඔබට ඉල්ලුම් කළ හැකිය. ඔබේ ළදරුවා ඉපදීමෙන් පසු එසේ නැතහොත් දරුකමට ලබාගත් පසු ඔබ තීරණය කරන ඕනෑම වේලාවක ඔබේ වැටුප ආරම්භ විය හැකිය. එය ආරම්භක දිනයේ සිට අඛණ්ඩව කාලසීමාවක් ඇතුළත ගෙවනු ලබන අතර මුළුමුදල උපතේ හෝ දරුකමට භාරගැනීමේ සිට අවුරුද්ද ඇතුළත ලබාගත යුතුය. කල්වේලා ඇතුව ඉල්ලුම් කිරීමට ඔබව උනන්දුකෙරේ.

### *සේවාදායකයා විසින් සපයන හිමිකම් පිළිබඳව කොහොමද?*

සුදුසුකම් ලබන දෙමාපියන්ට වෙනත් සේවාදායක නිවාඩු වැටුප් හෝ හිමිකම් ලබාගැනීමට පෙර හෝ පසුව හෝ එම කාළයේදීම දෙමාපිය නිවාඩු වැටුප් ලබාගත හැකිය. දීර්ග කාලීන සේවකයන් සඳහා දැනට පවත්නා අවම හිමිකම් වන 12 මාසයක වැටුප් රහිත දෙමාපිය නිවාඩුව වෙනස් නොවනු ඇත.

### *සේවාදායකයින්ට මෙහි අර්ථය කුමක්ද?*

2011 ජුලි 1 වෙනිදා සිට සේවාදායකයින් රජය මගින් ලබාදෙන දෙමාපිය නිවාඩු වැටුප, ඔවුන්ගේ සාමාන්‍ය වැටුප් චක්‍රය මගින් ඔවුන්ගේ ව්‍යාපාරයෙහි අඩුම වශයෙන් මාස 12 ක් සිටි සුදුසුකම් ලබන සේවකයන්ට ගෙවිය යුතුය. සුදුසුකම් ලබන වෙනත් දෙමාපියන්ට පවුල් දීමනා කාර්යාලය මගින් ගෙවනු ඇත.

### *මට තවත් තොරතුරු ලබාගතහැක්කේ කුමන ස්ථානයකින්ද?*

වැටුප් සහිත දෙමාපිය නිවාඩු ගැන වැඩිදුර දැනගැනීම සඳහා වෙබ් අඩවිය වෙත යන්න. නැතහොත් පහත දැක්වෙන අදාළ අංකයට අමතන්න.

**www.australia.gov.au/paidparentalleave**

**බහුභාෂීය දුරකතන මධ්‍යස්ථානය 13 12 02   දෙමාපියන් 13 61 50   සේවාදායකයන් 13 11 58**

PPLNP4/SINHALESE

**Paid Parental Leave**

A new entitlement for working parents

කැන්බරා, කැපිටල් හිල් හි ඕස්ට්‍රේලියානු රජය මගින් අනුමත කරන ලදී.